# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2006 අංක 2 දරන පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 ජනවාරි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 ජනවාරි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 6.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2006 අංක 2 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2006 ජනවාරි මස 19 වන දින]

L. D.— O. 5/2006.

**අනපේක්ෂිත හා හදිසි අවස්ථාගත කරුණු හේතුකොටගෙන ඡන්ද විමසීම් පැවැත්වීම කල් තබනු ලැබූ උතුරු හා නැගෙනහිර පළාත්වල ඇතැම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා අළුතින් නාමයෝජනා කැඳවීම සහ ඡන්ද විමසීම් පැවැත්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

උතුරු හා නැගෙනහිර පළාත්වල සියලු මහ නගර සභා, නගර සභා සහ ප්‍රදේශීය සභා සඳහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් නාම යෝජනා භාරගනු ලබන බවට දැන්වීම්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ කර ඇති හෙයින් ද : පූර්විකාව.

මහ නගර සභා තුනක් ද නගර සභා හයක් ද ප්‍රාදේශීය සභා හතලිස් හතරක් ද වෙනුවෙන් නාමයෝජනා ලැබී තිබුණු හෙයින් ප්‍රාදේශීය සභා හතක් සඳහා කිසිදු නාම යෝජනාවක් නොලැබුණු හෙයින් ද :

ඉහත සඳහන් සභාවලින් මහ නගර සභා තුනක්, නගර සභා හයක් සහ ප්‍රාදේශීය සභා පනස් එකක් සම්බන්ධයෙන් ඡන්ද විමසීම් පවත්වනු ලැබ සහ එම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ දිනය පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ 38 වන වගන්තිය යටතේ 2002 මාර්තු 25 වන දිනය ලෙස ඒ සභා සම්බන්ධයෙන් නියම කර තිබුණු හෙයින් ද :

එකී මහ නගර සභා තුන, නගර සභා හය සහ ප්‍රාදේශීය සභා පනස් එක වෙනුවෙන් වූ ඡන්ද විමසීම් සඳහා නියම කරන ලද දිනයන්, හදිසි හා අනපේක්ෂිත අවස්ථාගත කරුණු හේතුකොටගෙන, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් වරින් වර කල් දමනු ලැබූ හෙයින් ද :

එකී නාම යෝජනා භාර දුන් තැනැත්තන් මිය යාම හෝ අවතැන්වීම හෝ සිය පක්ෂ වෙනස් කිරීම, නාමයෝජනා භාර දුන් තැනැත්තන් සැලකිය යුතු සංඛ්‍යාවක් විදේශගත වීම යන කරුණු හේතුවෙන් හෝ යථෝක්ත නාමයෝජනා කැඳවනු ලැබූ අවස්ථාවේ දී වයස අවුරුදු තිස්පහට අඩු විය යුතුව තිබූ අපේක්ෂකයන් වයස අවුරුදු තිස්පහ ඉක්මවා ඇති හෙයින් ඉහත කී මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද :

එකී මහ නගර සභා තුන, නගර සභා හය සහ ප්‍රාදේශීය සභා පනස් එක සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු ඉකුත් වී ඇති කාලය හේතුකොට ගෙන එකී මහ නගර සභා, නගර සභා සහ ප්‍රදේශීය සභා සම්බන්ධයෙන් අලුතෙන් නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද අලුතෙන් ඡන්ද විමසීම පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2006 අංක 2 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නාමයෝජනා සහ තබා ඇති ඇප සම්බන්ධයෙන් විධිවිධාන.

2. (1) ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් ප්‍රකාර, I වන, II වන හා III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍ර, කිසිවිටෙකත් ඉදිරිපත් කරනු නොලැබූවාක් මෙන් වලංගු නොවන හා බලාත්මක නොවන ලෙස ද මෙයින් සලකනු ලැබේ.

(2) I වන, II වන හා III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

(3) I වන, II වන හා III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් යම් මහ නගර සභාවකට, නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට තෝරා පත්කර ගැනීම සඳහා ස්වාධීන කණ්ඩායමක් විසින් නම් කරනු ලැබූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ කර ඇති තැන්පතු, ආඥාපනතේ 30 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, ආඥාපනතේ 30 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තමන් වෙත නිකුත් කරනු ලැබූ ලදුපතක් එවැනි තැන්පතුවක් තැබූ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැන්පතුව කළ දින සිට මුදල් ආපසු ගෙවනු ලබන දිනය දක්වා වූ කාලයට වර්ෂයකට සියයට දොළහ (12%) බැගින් වූ පොලියක් සමග ඒ තැන්පත් මුදල ඒ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

**3**. I වන, II වන හා III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම් පිණිස, ආඥාපනත යටතේ පියවර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය : ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා ආරම්භ කළ යුතු පියවර.

එසේ වුව ද, ආඥාපනතට අනුකූලව, නාමයෝජනා පිළිබඳ දැන්වීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලබන දිනයක දී ද පළ කළ යුතු ය. එසේ වුව ද, ඒ දිනය මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට මාස හයකට පසු දිනයක් නොවිය යුතු ය.

**4**. මේ පනතෙහි "ආඥාපනත" යන්නෙන් ( 262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත අදහස් වේ. අර්ථ නිරූපණය.

**5**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

### I වන උපලේඛනය

### මහ නගර සභා

1. මඩකලපුව මහ නගර සභාව
2. යාපනය මහ නගර සභාව
3. කල්මුණේ මහ නගර සභාව

### II වන උපලේඛනය

### නගර සභා

1. කාත්තන්කුඩි නගර සභාව
2. චාවාකච්චේරිය නගර සභා
3. පේදුරුතුඩුව නගර සභාව
4. වැල්වැටිතුරේ නගර සභාව
5. ත්‍රිකුණාමලය නගර සභාව
6. වවුනියා නගර සභාව

III වන උපලේඛනය

**ප්‍රාදේශීය සභා**

1. නින්දවූර් ප්‍රාදේශීය සභාව
2. සමන්තුරේ ප්‍රාදේශීය සභාව
3. අද්දලච්චේනයි ප්‍රාදේශීය සභාව
4. අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව
5. පොතුවිල් ප්‍රාදේශීය සභාව
6. තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව
7. කෝරළෙයිපත්තු උතුරු ප්‍රාදේශීය සභාව
8. කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාව
9. කෝරළෙයිපත්තු ප්‍රාදේශීය සභාව
10. එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව
11. බටහිර මන්මුනෙයි ප්‍රාදේශීය සභාව
12. මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය සභාව
13. මන්මුනෙයි දකුණු සහ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාව
14. මන්මුනෙයිපත්තු නිරිත ප්‍රාදේශීය සභාව
15. නගරය හා කඩවත් ප්‍රාදේශීය සභාව
16. කුච්චවේලි ප්‍රාදේශීය සභාව
17. තම්පලගාමම් ප්‍රාදේශීය සභාව
18. කින්නියා ප්‍රාදේශීය සභාව
19. මුත්තූර් ප්‍රාදේශීය සභාව
20. කන්තලේ ප්‍රාදේශීය සභාව
21. ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
22. මොරවැව ප්‍රාදේශීය සභාව

23. පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව

24. සේරුවිල ප්‍රාදේශීය සභාව

25. චාවකච්චේරි ප්‍රාදේශීය සභාව

26. ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව

27. වේලනෙයි ප්‍රාදේශීය සභාව

28. කයිට්ස් ප්‍රාදේශීය සභාව

29. වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව

30. වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව

31. වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව

32. වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව

33. වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව

34. වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව

35. පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව

36. නල්ලූර් ප්‍රාදේශීය සභාව

37. වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

38. වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාව

39. වවුනියා උතුර ප්‍රාදේශීය සභාව

40. වෙන්ගලච්චෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාව

41. මන්නාරම ප්‍රාදේශීය සභාව

42. මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව

43. නානට්ටාන් ප්‍රාදේශීය සභාව

44. මුසාලෙයි ප්‍රාදේශීය සභාව

45. මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාව

46. පුතුකුඩුඉරිප්පු ප්‍රාදේශීය සභාව

47. තුනුක්කායි ප්‍රාදේශීය සභාව

48. මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව

49. කරච්චි ප්‍රාදේශීය සභාව

50. පූනකරි ප්‍රාදේශීය සභාව

51. පලච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.